# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2016

### 2022 මාර්තු/අප්‍රේල්
### මානවශාස්ත්‍ර පීඨය
### බෞද්ධ දර්ශනය - BUPH E 1025

### මූලාශ්‍රය අධ්‍යයනය හා ආදි බෞද්ධ නිකාය

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

1. බුද්ධකාලීන භාරතීය දාර්ශනික පසුබිම අධ්‍යයනයෙහිලා දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් ලැබෙන ආලෝකය ප්‍රමාණ කරන්න.

2. දුක්ඛනිරෝධගාමිනීපටිපදා ආර්ය සත්‍යය සච්චවිභංග සූත්‍රයට අනුව විවරණය කරන්න.

3. ශාස්වත උච්ඡේද අන්තවලින් විනිර්මුක්තව මධ්‍යම දේශනාව සිදුකරන අයුරු නිදාන වග්ගයේ අභිසමය සංයුක්තයට අනුව පැහැදිලි කරන්න.

4. ඉන්ද්‍රිය හා අරමුණු ගැටීමෙන් සිදුවන මානසික ක්‍රියාවලිය කරණකොට ගෙන පුද්ගලයා තුළ ඉන්ද්‍රයානුබද්ධ ඥාණය ජනිතවන අයුරු මධුපිණ්ඩික සූත්‍රය ඇසුරෙන් විස්තර කරන්න.

5. ගිහි-පැවිදි දෙපක්ෂයේම දෙලොව යහපත පිණිස හේතුවන වටිනා ධර්මෝපදේශ මාලාවක් ලෙස අංගුත්තර නිකාය, තිකනිපාතයේ මහාවග්ගය ඇගයීමට ලක්කරන්න.

6. මහාසාංඝික නිකාය ප්‍රභවය වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කොට තත් නිකායට අයත් මූලික ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.

7. පුද්ගලවාදය තහවුරු කිරීමෙහිලා පුද්ගලවාදීන් විසින් ඉදිරිපත් කොට ඇති සාධක කවරේදැයි මූලාශ්‍රයනයින් පෙන්වා දෙන්න.

8. ථෙරවාදී සම්ප්‍රදායයේ අනන්‍යතා ලක්ෂණ පිළිබඳ ගවේෂණයක යෙදෙන්න.

9. කාලත්‍රයවර්ති ධර්මයන්ගේ අස්තිත්වය තහවුරු කරනුවස් සර්වාස්තිවාදීන් විසින් ඉදිරිපත් කොට ඇති සාධක ගෙනහැර දක්වන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකකට (02)</u> ප්‍රමාණවත් විවරණ සපයන්න.
    i. සෞත්‍රාන්තික නිකාය
    ii. විසුද්ධිමග්ග
    iii. වසුබන්ධු හිමි
    iv. දෙවන ධර්ම සංගායනාව

**********************